# ආණ්ඩුවේ උභතෝකෝටිකය

සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ රැස්වීම් තාවකාලිකව කල්තබා ඇත්තේ මහජන එක්සත් පෙරමුණ මැදිහත්වීමෙනි. කමිටුවේ රැස්වීම් පවත්වාගෙන යන ආකාරය පිළිබඳව ඒ පක්ෂය විසින් ජනාධිපතිතුමන්ට කරුණු ඉදිරිපත්කරනු ලැබීමෙන් පසුව එතුමා පක්ෂ නායකයන්ගේ රැස්වීමක් පවත්වා ඒ පිළිබඳ තීරණයක් ගන්නා තෙක් සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ රැස්වීම් තාවකාලිකව කල්තැබීමට කටයුතුකරන ලෙස ශ්‍රී ල නි පක්ෂයටත් ම එ පෙරමුණටත් දැන්වීය. දැනටමත් පක්ෂ නායකයන්ගේ හා නියෝජිතයන්ගේ එක් රැස්වීමක් පවත්වා ඇත. එහෙත් ඒ රැස්වීම් සම්බන්ධයෙන් වැරදි ප්‍රවෘත්ති විවිධ පුවත්පත්වල පළවන්නේ ඒ ඒ පුවත්පත්වල න්‍යාය පත්‍රවලට සරිලන ආකාරයෙනි. ඇතැම් පුවත්පතකට අනුව එහි දී වෙනත් පක්ෂයක් කුමන්ත්‍රණකාරීව කටයුතු කර ඇත. ඒ පුවත්පතෙහිම වෙනත් තැනක පළවූයේ සර්වපාක්ෂික නියෝජිත කමිටු රැස්වීමට ප්‍රමාද වී පැමිණි ශ්‍රී ල නි ප හා ම එ පෙ නියෝජිතවරුන් රැස්වීම කල්තැබීමට යෝජනා කළ බව ය. එහෙත් සිදුවූයේ අනෙකකි. එකී රැස්වීමට කල් ඇතිව පැමිණි ඔවුන්ට එක් මුස්ලිම් පක්ෂයකවත් නියෝජිතයකු එනතුරු ඊනියා ගණපූරණයක් සඳහා බලා සිටිය යුතු විය.

මෙහි දී කිවයුතු කරුණක් වනුයේ සර්වපාක්ෂික කමිටුවේ සභාපති ද විටින් විට තම අදහස් කමිටුවේ අදහස් ලෙස පුවත්පත්වලට ප්‍රකාශ කරන බව ය. මේ සම්බන්ධයෙන් ම එ පෙ දැනට මාස කිහිපයකට උඩ දී ප්‍රකාශයක් ද කෙළේ ය. එමෙන් ම මේ තීරුවෙන් ද විටින් විට අදහස් ප්‍රකාශ කෙරිණි. විශේෂයෙන් ම සර්වපාක්ෂික කමිටුවේ සභාපති යනුවෙන් නිලයක් නැති බවත් අවශ්‍ය නම් ඒ ඒ රැස්වීමට මාරුවෙන් මාරුවට සභාපති කෙනකු පත්කරගැනීමට හැකිව තිබූ බවත් මේ තීරුවෙන් මෙන් ම අයිලන්ඩ් පුවත්පතින් ද අප ප්‍රකාශ කර සිටියේ ටික කලකට පෙර ය. ඒ තර්ක සුපුරුදු පරිදි වෙනත් අය විසින් ද දැන් යොදාගනු ලැබීම සතුටට කරුණකි. සඵ්වපාක්ෂික කමිටුවේ සභාපතිවරයා ප්‍රකාශ නිකුත් කර ඇත්තේ එ ජා පක්ෂයට හිතවත් පුවත්පත්වලට පමණක් නො වේ. ඔහු ඇතැම් විට පුවත්පත් සාකච්ඡා ද පැවැත්වී ය. එහි දී ඔහු පළකළ අසත්‍ය කරුණුවලට ආණ්ඩුවේ යැයි කියන ජනමාධ්‍යයෙහි ද වැදගත් තැනක් හිමිවිණි.

ඒ කෙසේ වෙතත් සර්වපාක්ෂික නියෝජිත කමිටුව ලවා ඉක්මන් තීරණ ගැන්වීමට බටහිර හා විජාතික බලවේගවලට හා ඔවුන්ගේ මෙරට සෘජු නියෝජිතයා වූ එ ජා පක්ෂයට අවශ්‍ය වී ඇති බව පැහැදිලි ය. එ ජා පක්ෂය දින නියම කර කියා සිටියේ අගෝස්තු පහළොවට පෙර යෝජනාවලියක් ඉදිරිපත්කරන ලෙස ය. එසේ නොකළහොත් තමන් සර්වපාක්ෂික කමිටුවෙන් ඉවත් වන බවත් ඒ පක්ෂය කියා සිටියේ ය. එහෙත් සර්වපාක්ෂික කමිටුවට එ ජා පක්ෂයේ දින නියම කිරීම් අවශ්‍ය නැත. සර්වපාක්ෂික කමිටුව අහවල් දවසට පෙර යෝජනා ඉදිරිපත් කළ යුතු යැයි කීමට එ ජා පක්ෂයටවත් බටහිර බලවේගවලටවත් නො හැකි ය. එවැන්නක් කිව හැක්කේ කමිටුව පත්කිරීමට කටයුතු කළ ජනාධිපතිතුමාට පමණ ය.

ජනාධිපතිතුමා අද එවැනි දින නියමයක් කිරීමට සූදානම් බවක් නො පෙනෙයි. එහෙත් එතුමාට බටහිර බලවේගවලින් බලපෑම් එල්ලවන බව පැහැදිලි ය. බටහිරයන් සිංහලත්වය නැති කිරීමට හෝ අඩුම තරමින් දුර්වල කිරීමට හෝ දෙමළ ජාතිවාදය යොදාගන්නා බව අප කලින් කිහිප වතාවක් ම කියා ඇත. බටහිරයෝ ආණ්ඩුව ලවා තම යෝජනා ක්‍රියාත්මක කරවීමට උත්සාහ දරති. ඔවුන්ගේ යෝජනාවෙහි පැහැදිලිව ම ඇත්තේ ඒකකය පළාත වූ ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයකි. ආණ්ඩුව ඒ පිළිගතහොත් ජ වි පෙ එයට විරුද්ධ වනු ඇත. එවිට ජ වි පෙරමුණට ද සන්ධීය රාජ්‍යයකට විරුද්ධ වී කිනම් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ ද යන ප්‍රශ්නය පැන නගිනු ඇත. සන්ධිය ක්‍රමයකට විරුද්ධ වූ පමණින් ඔවුන්ට එ ජා පක්ෂය සමග එක්වී කටයුතු කළ නො හැකි ය. එසේ වුවත් එවැනි අවස්ථාවක ජ වි පෙ ආණ්ඩුව රැකීමට ඉදිඵිපත් වේ යැයි සිතීමට ඇති ඉඩකඩ අඩු ය.

මංගල සමරවීර මහතා වරද්දා ගත්තේ ද ජ වි පෙරමුණ ඔහු හා එක් වේ යැයි සිතීමෙනි. ජ වි පෙරමුණට අද එ ජා පක්ෂය සමග සංධාන ගතවීමේ ඉඩක් නැත. ලබන අයවැය විවාදයේ දී ජ වි පෙ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දීමට වුව ද ඉඩක් ඇති නමුත් ඒ සමග ආණ්ඩුව බලයෙන් පහවුවහොත් ජ වි පෙරමුණට ද යන එන මං නැතිවනු ඇත. ජාතික හෙළ උරුමයට ද ඒ ප්‍රශ්නය එපමණකින් ම නොවුණ ද යම් ප්‍රමාණයකට එල්ල වනු ඇත. අද ජා හෙ

© Prof. Nalin De Silva

උරුමයට ජාතික බලවේගවල හා ජ වි පෙරමුණේ බලපෑම හේතුකොට ගෙන ජාතිකවාදී මතවාදවලින් තොර දේශපාලනයක් නැත. එහෙත් කලකට ඉහත දී ජ වි පෙරමුණට බලපෑම් දැමීමට හෙළ උරුමයට හැකි විය. මේ පක්ෂ දෙකේ ම ඡන්ද පදනම ප්‍රධාන වශයෙන් ම ජාතික මතවාද දරන්නන් ය.

අනෙක් අතට ආණ්ඩුව බටහිරයන්ගේ බලපෑම නොසලකා හැර ඒකීය රාජ්‍යයකට කැමති වුවහොත් ඔවුන් ආණ්ඩුව වැට්ටවීමට ක්‍රියාකරනු ඇත. දැනටමත් බටහිරයන් ආණ්ඩුවට දෙන ණය විශාල වශයෙන් කපාදමා ඇති අතර ඉදිරි කාලයේ දී ඒ කපාදැමීම් හා තහංචි තව තවත් වැඩිකරනු ඇත. ආණ්ඩුවට අද වාණිජ බැංකුවලින් ණය ගැනීමට සිදුවී ඇති අතර එ ජා පක්ෂය ආණ්ඩුවට ණය දීමට ඉදිරිපත්වන්නන්ට ලිපි යවමින් එ ජා ප ආණ්ඩුවක් යටතේ එවැනි ණය නොගෙවන බවට තර්ජනය කරයි. මේ භයානක තත්වයකි. ඉතා පැහැදිලිව ම බටහිරයන් හා එ ජා පක්ෂය ආණ්ඩුව වැට්ටවීමට අත්වැල් බැඳගෙන ක්‍රියාකරයි. වැඩිකලක් යෑමට මත්තෙන් මෙරට මූල්‍ය අර්බුදයක් ඇතිකිරීම බටහිරයන්ගේ ක්ෂණික උපාය බවට පත් වී ඇත.

ආණ්ඩුව අද ගෙදර ගියොත් අඹු නසී මග හිටියොත් තෝ නසී තත්වයකට පත්වී ඇත. මේ තත්වයෙන් ගොඩඒම පහසු කටයුත්තක් නොවන බව පැහැදිලි ය. අද ආණ්ඩුවේ සිටින ඇතැම් පක්ෂ අර්බුදය මෝරත් ම ආණ්ඩුවෙන් ඉවත්වනු ඇත. ඒකීය රාජ්‍යයකට කැමැත්ත පළකර ජ වි පෙරමුණේ සහායෙන් ආණ්ඩුව පවත්වාගෙන ගිය ද බටහිරයන්ගේ බාධක හා තහංචි හමුවේ රට කරගෙන යන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ආණ්ඩුව හමුවේ ඇත.

අද වන තුරු ද ආණ්ඩුව මේ සම්බන්ධයෙන් සැබෑ තතු මහජනතාවට ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම කණගාටුදායක ය. ඉදිරියේ දී ඇතිවිය හැකි අර්බුදයට මුහුණ දෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ ජනතාව දැනුවත් කිරීමක් අද අවශ්‍ය වී ඇත. රටේ ජනතාවගෙන් සියයට හතළිහක් පමණ එ ජා පක්ෂයට ඡන්දය දෙන බවත් පාවෙන ඡන්ද යම් ප්‍රමාණයක් ඇති බවත් ආණ්ඩුවට අමතක කළ නො හැකි ය. එ ජා පක්ෂය අර්බුදකාරී අවස්ථාවක දී මේ පිරිසෙන් යම් ප්‍රමාණයක් පාරට බැස්සවීමට කටයුතු කරනු ඇත. අප බොහෝ දෙනා සිතන්නේ ජනතාව පාරට බැස්සවීම වමේ යැයි කියාගන්නා පක්ෂවල පමණක් කාර්යයක් බව ය. එහෙත් ඇතැම් තත්වයන් යටතේ දක්ෂිණාංශික පක්ෂ ද ජනතාව පාරට බස්සවන බවත් එහි ප්‍රතිඵල ෆැසිස්ට්වාදී ආණ්ඩු බවත් අමතක නොකළ යුතු ය.

ෆැසිස්ට්වාදීන් වීමට බලා සිටින්නවුන් ආණ්ඩුවේ මෙන් ම විපක්ෂයේ ද ඇත. ඒ අයට වාසි ගෙන දෙන වාතාවරණයක් අද ක්‍රමයෙන් නිර්මාණය වෙමින් පවතියි. මේ වාතාවරණය නැතිකිරීමට ආණ්ඩුව කටයුතු කළ යුතු ය. ඇතැමුන් සිතන්නේ ෆැසිස්ට්වාදී රාජ්‍ය බිහිවන්නේ ජාතිකවාදී මත දරන්නන් මගින් පමණක් බව ය. එහෙත් එය එසේ නො වේ. කිසිම ජාතිකත්වයක් නැති විජාතික බලවේගවල ඒජන්තයන් අතින් ද ෆැසිස්ට්වාදී රාජ්‍ය බිහිවිය හැකි බවට දකුණු ඇමරිකාවෙන් වුවත් සාක්ෂි සපයාගත හැකි ය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නැවතත් දේශපාලන කටයුතුවල නිරත වෙයි. ඇයට අද බලයක් නැති වුවත් ඇය 1992 දී මෙන් ම අදත් විජාතික බලවේගවල නියෝජිතවරියක් වන්නී ය. පෘතුගීසීන්ගේ නියෝජිතවරිය ලෙස පැමිණි දෝන කතිරිනා ජාතිකත්වය සඳහා යොදාගැනීමට විමලධර්මසූරිය රජු ක්‍රියාකළ අයුරින් ජාතික බලවේගවලට ඇය යොදාගත හැකිවුයේ ඉතා සුළු කාලයකට පමණ ය. ඒ පසු කලෙක රනිල් වික්‍රමසිංහ මහතාට එරෙහිව ය. එහෙත් අද ඇය මංගල සමරවීර මහතා සමග සිටින්නේ රනිල් වික්‍රමසිංහ මහතා ගේ විජාතික සමාගමේ ය. ඒ කෙසේ වෙතත් ඇයට දේශපාලනයෙහි යෙදෙන අතර හිටපු ජනාධිපතිනියකට (ජේ ආර් ජයවර්ධන මහතාට අනුව නම් හිටපු යන්න යොදාගැනීම නුසුදුසු ය.) හිමි වරප්‍රසාද භුක්තිවිඳිය හැකි ද යන ප්‍රශ්නය මතුවෙයි. ජයවර්ධන මහතා හා විජේතුංග මහතා ජනාධිපති පදවියෙන් ඉවත්වීමෙන් පසු දේශපාලනයෙන් විශ්‍රාම ගත්හ.

කුමාරතුංග මහත්මිය බලවේගයක් නොවුව ද, අද ආණ්ඩුවට විරුද්ධ විජාතික බලවේග පෙළ ගැසෙමින් ඇත. ඉදිරි අයවැය සම්මත කරගැනීම අද ආණ්ඩුවට ඇති ප්‍රධාන ප්‍රශ්නය විය හැකි ය. එහෙත් ඒ ක්ෂණික ප්‍රශ්නය පමණකි. දීර්ඝකාලීනව ආණ්ඩුව සැලැස්මක් ඇතිව ක්‍රියා නොකරන්නේ නම් රටට සුබදායක අනාගතයක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva